මගේ අංකය : JSC/SEC/CIR –L/2022

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 13/ 2022**

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්, විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් වෙත,

<u>නිල රථය භාවිතා කිරීම සම්බන්ධවයි.</u>

ශීර්ෂගත කාරණයට අදාලව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) ආර්. එස්. හපුගස්වත්ත මහතා විසින් මා අමතා ඇති අංක : MOJ/E17/T/36 TEM හා 2022.11.14 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මඟින් පරිහරණය සඳහා විනිශ්චයකාරවරුන්ට සහ අධිකරණ නිලධාරීන්ට ලබා දෙන මෝටර් රථ සුරක්ෂිතව භාවිතා කර නැවත අමාත්‍යාංශය වෙත භාරදීමේ වැදගත්කම ඔබට අවධාරණය කරන ලෙසට මට නියම කර ඇත.

02. ඔබගේ දැනගැනීම සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) ආර්. එස්. හපුගස්වත්ත මහතා විසින් මා අමතා ඇති අංක : MOJ/E17/T/36 TEM හා 2022.11.14 දිනැති ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 නොවැම්බර් මස 25 වෙනි දින

කොළඹ 12

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය

දුරකථනය / தொலைபேசி / Telephone 2449959
ලේකම් / Secretary
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785
Web Site: www.moj.gov.lk

**අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

**நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு**

**Ministry of Justice, Prison Affairs and Constitutional Reforms**

ඉලෙක්ට්‍රොනික තැපැල / மின்அஞ்சல் / E-mail info@moj.gov.l

නො 19, ශ්‍රී සංඝරාජ මාවත
කොළඹ 10
இல 19, ஸ்ரீ சங்கராஜ மாவத்த
கொழும்பு 10
No 19, Sri Sangaraja Mw
Colombo 10

මගේ අංකය / எனது இல / My No. MOJ/E17/T/36 TEM
ඔබේ අංකය / உமது இல. / Your No. M/DC/E/DJ/2022
දිනය / திகதி / Date 2022.11.14

ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව,
කොළඹ 12.

<u>නිල රථය භාවිතා කිරීම සම්බන්ධවයි.</u>

මෙම අමාත්‍යාංශය මගින් විනිසුරුවරුන් වෙත ලබා දී ඇති නිල වාහන රජයේ දේපොලක් වන බැවින් මුදල් රෙගුලාසි 128 (1) (ඉ) වගන්තිය ප්‍රකාරව එම වාහන සුරක්ෂිතව හා ඒවායේ ආරක්ෂාව තහවුරු වන පරිදි භාවිතා කිරීම අදාල විනිසුරුවරුන්ගේ වගකීමක් වේ.

02. නමුත්, ඉහත ආකාරයට විනිසුරුවරුන් වෙත ලබා දී ඇතැම් මෝටර් රථ සුරක්ෂිතව භාවිතා නොකරන බවට විගණන විමසුම් ඉදිරිපත්ව ඇත.

02. එබැවින්, උක්ත කරුණ සැලකිල්ලට ගෙන විනිසුරුවරුන් වෙත ලබා දී ඇති මෝටර් රථ සුරක්ෂිතව භාවිතා කර නැවත අමාත්‍යාංශය වෙත භාර දෙන ලෙස නිල රථ භාවිතා කරන විනිසුරුවරුන් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ආර්. එස්. හපුගස්වත්ත
අතිරේක ලේකම් (පාලන)
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.